

# කියන්න තරම් විශේෂ දෙයක් ලාංකීය කවියෙ සිද්ධ වෙන්නෙ නෑ.

## මංජුල වෙඩිවර්ධන

**කවිය අරභයා පසුගිය කාලයේ කෙබඳු සාහිත්‍යමය මැදිහත් වීමක්ද ඔබ අතින් සිදුවුණේ? විශේෂයෙන් මෑතක දී ඔබ අතින් බිහිවූ 'පිටුවහල් පිටු' නම් සේයා-කාව්‍ය කෘතියත් ඇතුළත්ව.**

මගේ කවිය කියන්නෙ එක පැත්තකින් සමාජයට හා අනිත් පැත්තෙන් මගේ ජීවිතයට මම ප්‍රතිචාර දක්වන විදිහ. මේ කවර අර්ථයකින් ගත්තත් ඒක දේශපාලනික මැදිහත්වීමක්. පාඨකයා,මේ කවි විසින් සහෘදගත කෙරෙනවද නැද්ද කියන එක ද්වීතීයය කාරණාවක්.

මගේ මැදිහත්වීම හෝ සම්ප්‍රදානය් අලුතිනී කවි ලියන, කවියේ තම අනන්‍යතා ලකුණු කරගනිමින් ඉන්න, කවීත්වයේ කොපුව සහ පපුව යන දෙකම ගැන අවධානයෙන් ඉන්න අලුත් කවි පරම්පරා-වෙන් අහුවොත් ඕකට උත්තර දෙයි.

අනිත් පැත්තෙන් 2009 සංහාර සමය ගත්තොත් යුද්ධයට එරෙහිව, උතුරු ආක්‍රමණයට එරෙහිව අඛන්ඩව සිංහල සමාජය රිද්දමින් හිටියෙ කවිය විතරයි. සමස්ථ වශයෙන් දකුණ, සමාජයක් විදිහට සාමුහිකවම, උතුරෙ දෙමළ මිනිස්සු කඳු ගහන එකට පක්ෂව අත ඔසවද්දි ඒකට එරෙහිව අඛන්ඩව සමාජය ශෝධනය කළේ කවිය විතරයි. කවිය නිසා තමයි සංහාරයට විරුද්ධ අතිශයින් අල්ප, හදවත් සහිත හැමෝම වේදනාව අත්විඳගත්තෙ. මහේෂ් මුණසිංහ, අජිත් සී.හේරත් ප්‍රමුඛ කවීන් කිහිපදෙනෙක් මේ සමාජ මැදිහත්වීම කළා. තරංග ජයසේන, මාලතී කල්පනා ඇම්බ්‍රෝස්, සුභද්‍රා ජයසුන්දර, අරවින්ද පෙරේරා, රෝහණ පොතුලියැද්ද, ටිම්රාන් කීර්ති, කුමාරි ප්‍රනාන්දු මතකයේ පැළපදියම් වුණු කවීන්. ඒ නිශ්චිත ජන සංහාරක මොහොතෙ නිහඬව හිඳිමින් මෙන්ම සෘජුව හා වක්‍රව ඒකට දායක වුණු කවීන් දැන් දෙමළා ගැන මෙන්ම වෙනත් බේදවාචකයන් ගැන කඳුළු පෙරෙන කවි ලිව්වත් ඒවා ලේ ගෑවුණු විලාප සහ අඳෝනා කවි මිසක්, පිරිපහදු කවි නෙමේ. පුද්ගලිකව ගත්තම ඒ යුගයේ මා අවමානයට පාත්‍රකළේ 'අධම කවියා' නමින්. එකෙන් ගම්‍ය වෙනවා නේද මගේ සම්ප්‍රදානය. 'පිටුවහල් පිටු' කියන්නෙ මේ නිශ්චිත මොහොතේ මම මගේ ජීවිතයට ප්‍රතිචාර දක්වන විදිහ. ජීවිත විෂයෙහි ඇලලුණ සේ බැලූ බැල්මට පෙනුනත්, ඒ පිටු අතර තියෙන්නෙ රිද්දනසුළු දේශපාලන කාරණා. ඒ කාරණාත් එක්ක තාමත් දකුණේ සිංහල සමාජය දුරස්ථයි. ඒ හින්දා සුපුරුදු ලෙස දකුණෙ අධිපති දෘෂ්ටිවාදයට මගේ කවි අතහැරෙනවා. අතාරින්න බලකරනවා.

**'නූතන ලාංකීය කවිය' ගැන ඔබේ කියැවීම මොන වගේද?**

එහෙම විශේෂ දෙයක් කියන්න තරම් විශේෂ දෙයක් ලාංකීය කවියෙ සිද්ධ වෙන්නෙ නෑ. එහෙම විශාල දෙයක් කියන්න තරම් විශාල දෙයක් සිද්ධවෙන්නෙ නෑ. එහෙම විශාල දෙයක් හෝ විශේෂ දෙයක් කරන්න උත්සාහ කරපු හෝ උත්සාහ කරමින් ඉන්න නිර්මාණකරුවෙක් ගැන මම දන්නෙ නෑ. කවිය කියන්නෙ සයිඩ් බිස්නස් එකක් වගේ වැඩක්. කවීන් කියලා අධිනිෂ්චය වෙච්ච හැමෝටම විවිධ දේ තියෙනවා කරන්න. සමහරු සරුංගල් අරින අතරෙ කවි ලියනවා. සමහරු මුතු කිමිඳෙන අතරෙ කවි ලියනවා. සමහරු ඔරු පදින අතරෙ කවි ලියනවා. සමහරු අවි ඔපදමන අතරෙ කවි ලියනවා. මෑතකදි කවියට වෙච්ච විශාලම දේ තමයි ලෝක කවි දිනයැයි කියන දිනයට ආණ්ඩුවෙ අනුග්‍රහයෙන් කවි මඩුවක් පැවැත්වීම. ඒකෙදි විශාල අරගලයක් කරලා, සමස්ථ වැඩෙන් පොඩිවෙලාවක් පැහැරගෙන, කවිය ගැන ඇත්ත රිදුමක් තියෙන නූතන කවීන් කිහිප දෙනෙක් බලහත්කාරයෙන් වගේ කවි කිහිපයක් කියෙව්වා. ඒ අවස්ථාවක් ගන්න වුණත් කවුරුහරි දේශපාලන හයියක් තියෙන කවියෙක් වගේ කෙනෙක් තල්ලුවක් දෙන්න ඇති. රටේ ජනාධිපතිවරයා හිතන් ඉන්නෙ කවිය කියන්නෙ හිට්වන කවියට කියලා. කවිය පිළිබඳ දාෂ්ටිවාදය වෙන්න නියමිත ඒක.

අනිත් පැත්තෙන් ක්ෂුද්‍ර කවිය සීගිරිය පැත්තට හරව ගන්න ව්‍යාපාතිය. කෙටිකතාව ජාතක කතාවෙන් පැන නඟෙන බවට ගෙනා ප්‍රවාදය වගේ කෙටි කවිය සීගිරියෙන් ආවා කියන එක මරු අදහසක්. වැඩේ කියන්නෙ ඒ වැඩේ පුරෝගාමී ආරියවංශ රණවීර කවියා බටහිර තිබිලා ක්ෂුද්‍ර කවිය හොයාගෙන දශක තුනකට විතර පස්සෙ තමයි කැටපත්පවුරෙ තිබුණු සීගිරි කවිය හොයාගෙන තියෙන්නෙ. මම මේ ගැන තරමක් දීර්ග රචනාවක් ලියමින් ඉන්නෙ. ඔය හදන්නෙ ඔය කියන සාර සංක්ෂිප්ත කවිය තමන් දැනුවත්ව පෝෂණය කරන සිංහල බෞද්ධ අධිපති දෘෂ්ඨිවාදය එක්ක ගැටගහන්න හදන එක.

**නවකතාවට සාපේක්ෂව කවියට තියෙන අවකාශය අවම බව කියවුණාට අද දවසේ කවිය මුද්‍රණයෙන් නිකුත් වීම විශාල වශයෙන් සිද්ධවෙනවා. නමුත් මේ ප්‍රමාණාත්මක ඉහළයාමට සාපේක්ෂව කවිය ගුණාත්මක ඉහළ ගිහින්ද?**

නිර්දය අදහසක් විදිහට මේ පිටවෙන හැමපොතක්ම හිස් කියලා කියන අදහස සමාජගත කරන්න මං දායක වෙන්නෑ. නමුත් මේ කාව්‍යෝද්යෝගය පිරිපහදු කිරීමට දායක වෙන්න බැරිකමක් නෑ. මොකද මේ හැම කවිපොතකම ඇතැම් විට එක හොඳ නිර්මාණයක් හරි තියෙන්න පුළුවන් හින්දා. මොකද ප්‍රමාණාත්මක දේ නෙවෙයි කවීත්වය පිළිබඳ නිර්ණායකයන් සපයන්නෙ. නාසි විරෝධී ජර්මානු දේවධර්මවේදියකු වුණු මාටින් නීමොලර් ගැන ලෝකෙම දන්න එක ලියවිල්ලක් නිසා. ඔහු වෙන කිසිවක් ලියලා තියෙනවද කියලා කාගෙන් හරි ඇහුවොත් නිෂ්චිත උත්තරයක් හොයා ගන්න බැරි වෙනවා.

අනිත් පැත්තෙන් ගත්තොත් දයාසේන ගුණසිංහ කිව්වා පොතක් බිහිවන හැමවිටම කවියෙක් බිහිවෙන්නෙ නෑ කියලා. මං කැමතියි මා විශ්මයට පත්වන කවි කියවන්න. මා රිද්දන්න සමත් කවි කියවන්න. නිෂ්චිත කිසිම දෙයක් ඒ තුළ නොතිබුණාට කමක් නෑ, නමුත් මාව හෙල්ලිලා යන්න ඕනි. එහෙම කවියක විතරයි නිෂ්චිත රාමුවකට දා ගන්න බැරි අවසාන ධාරණාව ඇවිත් යළි ඒ කවිය වෙත අප කැඳවගන්න පුළුවන්.
මෙහෙම කවි අපිට හමුවෙනවා. ඒ කියන්නෙ ඒවා තියෙනවා.

ව්‍යාජ දාර්ශනික ඔලොගු පටලව ගත්තු කවි නෙවෙයි ඒවා. ජීවිතය පතුළෙන් නැඟෙන කවි. කැණේඩියානු කිවියර ලෙයොනාර්ඩ් කොහෙන් කියනවා කාව්‍යය කියන්නෙ ජිවිතය පිළිබඳ සාක්ෂි සටහන් කියලා. ඔබට තියෙන්නෙ ඉතා හොඳට පත්තුවෙලා ඇවිලිලා යන ජිවිතයක් නම්, ඔබේ කවිය කියන්නෙ අළු කියලා ඔහු කියනවා. මං මේ කියන්න හදන එක, ඒ කියන්නෙ කවියේ මේ කියන කොලිටිය සහ ඔරිජිනලිටි එක එදා ධර්මසිරි රාජපක්ෂගෙ කවියෙ තිබ්බා. ඊළඟට චන්ද්‍රකුමාර වික්‍රමරත්නගේ කවියෙ තිබ්බා. අද ගත්තොත් ටිම්රාන් කීර්තිගෙ සහ ඩොමිනික් චන්ද්‍රසාලිගෙ කවියෙ අළු ලෙස ඉතුරුවෙන කවිය තියෙනවා. හැමයුගයකම ඒක එහෙම තමයි. කවි ලියන අය හිටියට, කවීන් බුරුතු පිටින් බිහිවෙන්න විදිහක් නෑ. ස්ත්‍රීන් විදිහට ගත්තොත්, මට අනුව, කවිය එහි භාෂාව තුළත්, භාෂාවෙන් පිටත් රමනීය ලෙස හා බරපතල ලෙස ලියන්නෙ සුභද්‍රා ජයසුන්දර සහ මාලතී කල්පනා ඇම්බ්‍රෝස්. විපුලි නිරෝෂිනී, තරංගා රණසිංහ, සංජීවනී කස්තුරිආරච්චිගෙ සම්ප්‍රදානය අපිට අතහැර යන්න බෑ. මං මේ කතා කරන්නෙ නූතනම පරම්පරාව ගැන නෙමෙයි. චන්ද්‍රකුමාරගෙන් පස්සෙ කවිය ඉදිරියට තල්ලු කරන්න දායක වුණා කියලා මා විශ්වාස කරන අධිපතිවාදී ප්‍රවාහයට එරෙහිව හිටගත්තු මේ අය අතුරින් මට පූර්වව මෙන්ම මට සමාන්තරව කවි ලියපු මා ආශ්වාදයට හා විශ්මයට පත් කළ, එමෙන්ම විශාල අනන්‍යතාවක් තිබුණු කවින් තමයි රෝහිත භාෂණ අබේවර්ධන, කමල් පී. අලහකෝන්, අනුර කේ. එදිරිසූරිය, ශ්‍යාමන් රජින්ද්‍රජිත් ගමගේ, රුවන් ආන්ජිලෝ ජයසිංහ, නිල්මිණී සිරිවර්ධන, දර්ශන මේදිස්, අජිත් සී. හේරත්, අශෝක කාරියවසම්, රෝහිණී චිත්‍රා ජයවර්ධන, ඩී.එම්.එස්.ආරියරත්න, මනෝරා ප්‍රභානි තෙල්මා, සුධර්මන් රංජිත්, චමින්ද තුෂාර ගමගේ, නිමල් රත්නායක, ධර්ම බුලත්සිංහල. මේ අය එක්කො එක් කවි පොතක් පළ කළ ඇය. නැත්තං කවි පොත් පළ නොකළ අය. ශ්‍රී ලාංකික සිංහල කවිය අධ්‍යනය කරන කෙනෙක්ට මේ කවීන් අතෑරලා යන්න බැරි බවයි මගේ අදහස. මං කවියත් එක්ක අඛන්ඩව සක්‍රියව හිටපු හින්දා මාව දන්න අද කවි ලියන පරම්පරාව, බොහෝ විට මේ කවීන් ගැන දන්නෙ නෑ. මං යෝජනා කරන්නෙ, මං මේ කියන දේ ඇත්තක්ද නැද්ද කියල බලන්න කෙසේ හෝ ඔවුන්ව හොයාගෙන කියවන්න. කවිය ගුණාත්මකව ඉහළ යන්න නම් මේ කවීන් සහ ඔවුන් මොනවද කළේ කියන දේ පිළිබඳ සංවාදය ඇරඹෙන්න ඕනි. මං මේ කියන කවීන් අඛන්ඩව මෙන්ම මේ මොහොතෙදිත් සක්‍රිය කවින් වී නම් අද සිංහලෙන් ලියන කවිය තියෙන තැන හිතාගන්න බෑ. පුද්ගලිකව මේ කතාව මට අදාලව කියාගන්නවා නම්, මං කියන්නෙ මෙහෙමයි. මම මොන කවියෙක්ද, මෙන්න කවීන් කියලා.

**පසුගිය වසර දෙක තුන, එනම් මෑත අතීතය ගත්තොත් ඔබ සිත් ගත් වඩා හොඳ කවි පොත් මොනවාද? ඒවා එසේ විශේෂිත වන්නේ ඇයි?**

'මං කියවපු පොත් වලින්' මං විශේෂයෙන් කැමති රුවන් බන්දුජීවගෙ 'මීළඟ මීවිත', දමිත්ගෙ උදයංග දහනායකගෙ 'තෙමි තෙමීම මම', ඉසුරු චාමරගෙ 'අප දෙදෙන මැද මහ මුහුද'. ඔවුන් කවි ලියන අය විතරක් නෙමෙයි, කවීන් බවට පත්වෙලා ඉන්නෙ. ඒ කවි හරිම අනන්‍යයි. ඒවා කියෙව්වම කවියා කවුද කියලා හොයා ගන්න කවිය යට නම තියෙන්න ඕනි නෑ.

'මාරියාව' කියවලා පපුවෙ හංගං හිටපු හැඟිම් කැබැලි බැබැලි ඔන්න ආයෙ අජිත් තිලකසේනගෙ 'එළඹෙන අගෝස්තුව' එක්ක හොල්මං කරන්න පටන් ගත්තා. ඒ පොත හරිම ගති. පෙර කී තිදෙනා තරුණයි. එත් අජිත් කියන්නෙ සදාකාලික තරුණයෙක්. මේ පොත් විශේෂිත වෙන්නෙ ඒවා ඇතුළෙ තියෙන කවි විශේෂිත කවි හින්දා.

**අලුත් පරපුර කවිය පිළිබඳ ඉතා ප්‍රමෝදයකින් ඉන්නා බවක් නිතර දෙවේලේ පළවන ෆේස්බුක් හා අනෙකුත් සයිබර් කවි පිටු හරහා දැකගත හැකියි. ඔබ මෙය දකින්නේ කෙළෙසද?**

ඒක තමයි ප්‍රමෝදය කියන්නෙ.

**කවි ලියනවුන් අතරෙත් ගුරුකුල තියෙන බව සඟවන්න අවශ්‍ය නැහැ. මෙය කෙතරම් දුරට කවියටත්, කවියන්ටත් බලපානවද? උදාහරණ දෙන්න පුළුවන්ද?**

සඳැස් කවි සංගම් වගේ සරල ඒවා ඇරුණම ගුරුකුල කියල දෙයක් මට නම් පේන්න නෑ. ඊට අමතරව, කවිය නම් සංක්ෂිප්ත විය යුතු යැයි කියමින් මැරෙන්න හදන ගෝත්‍රවාදයක් නම් තියෙනවා. ගුරු කුල තියෙනවා නම් ඒ ගුරුකුලයෙන් මාර වැඩක් වෙලා තියෙන්න එපැයි. කෝ? එහෙම නෑනෙ. දකුණෙ සමාජය කියන්නෙම ගෝත්‍රවාදයට නතු වෙච්ච තැනක්. ඒ ගෝත්‍රවාදය ඇතුළෙ කවිය තවත් ගෝත්‍රවාදයක් තුළට දක්කනවා කියන්නෙ ගෝත්‍රවාදය වර නැඟෙනවා කියන එක. ඒක කවියට බලපානවා. අධිපති දෘෂ්ටිවාදයට කවිය ගැටගහන්න හදන ව්‍යාපාරයක් තමයි ඕක. නන්දන වීරසිංහ වගේ ඉදිරිගාමී භාෂා භාවිතයක් සහ සමාජ භාවිතයක් තිබ්බ කවියෙක් ඉවර වුණේ මේ ගෝත්‍රවාදය ඇතුළෙ. මං කලිනුත් කිව්වා මං මේ කියන එක මේ වන විට සීගිරි කැටපත් පවුර ඉස්සර නතරවෙලා සීගිරි කවි කියවනවා.
නමුත් ආචාර්ය ලියනගේ අමරකීර්ති වගේ කවියෙක් ඔහුගේ ඇකඩමික් වපසරිය තුළ ඇකඩමික් ශ්‍රමය යොදවමින් ගුරුකුල හෝ ගෝත්‍රික නොවෙන වැඩකොටසක් කරමින් ඉන්න බව පේනවා. කවිය වැඩබිමක් කරගෙන ඔහු හා ඔහු වටේ ඉන්න විද්‍යාර්ථීන් කවිය විවිධාකාරව වරනඟමින් ඉන්න බව පේනවා. විශ්‍රාම මණ්ඩප වල කෙරෙන කුමන්ත්‍රණ වලට වඩා කවිය වෙනුවෙන් කෙරෙන මෙවන් අධ්‍යන අතිශයින් වැදගත් බවයි මට හිතෙන්නෙ.

**නූතන කවිය විවිධාකාර ආකෘති මත රඳා පවතිමින් ලියැවෙනවා වුණත් ඒ අතරින් ඔබ ඔය කියන සංක්ෂිප්ත කවිය හිස ඔසවන්න උත්සාහ ගන්නවා නේද? එය කොරහේ කිඹුලන් දැකීමක් ලෙස ඇතැමුන් කියනවා. ඔබේ අදහස මොකද්ද මේ ගැන?**

සංක්ෂිප්ත කවියට ආයෙ අමුතුවෙන් හිස ඔසවන්න දෙයක් නෑ. ඒක දැනටමත් තියෙන දෙයක්නෙ. සංක්ෂිප්ත කවිය අතිශයින්ම නූතනවාදී කවියක්. නමුත් ඒ නූතනවාදී කවිය සිංහල කවිය තුළ ස්ථානගත කෙරුණෙ වැඩවසම් ආකෘතියක. අධිපති දෘෂ්ටිවාදයට කවිය විශාල පීඩනයක් වෙයි කියලා හිතුණ පසුබිමක ඒක සමනය කරලා තනුක කරන්න තමයි මේ ක්ෂුද්‍ර කවිය කවීන්ගෙ ගෙට ගෙවදින්නෙ. අසූව දශකයෙ ඉඳන් අඛන්ඩව කවියත් එක්ක විතරක්ම දිග කාපු එකම විශිෂ්ඨයා වුණු නන්දන වීරසිංහට වෙච්ච දේ විතරක්ම ගත්තත් මං මේ ගොඩනඟන තර්කනය තේරුම්

26 වන පිටට